# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,936/4 — 1970 දෙසැම්බර් 17 වැනි බ්‍රහස්පතින්ද — 1970.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 31/47

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත

**84 වැනි වගන්තිය යටතේ වූ ආඥාව**

(262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 84 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති, ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම,

(අ) බේරුවල නගර සභාවේ පහත සඳහන් එක් එක් කොට්ඨාශය එනම්—අංක 1, 2, 3, 4, 5, 6, 7 සහ 8 දරණ එක් එක් කොට්ඨාශය සඳහා සභිකවරයකු තෝරා ගැනීමේ කාර්‍යය පිණිස ඡන්දය විමසීම පැවැත්වෙන දිනය වශයෙන්, 1970 දෙසැම්බර් 19 වැනි දින නිශ්චිත ලෙස නියම කරමින්, කළුතර දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින්, ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ 38 සහ 41 වැනි වගන්ති යටතේ ප්‍රසිඩ කරන ලද 1970 දෙසැම්බර් 3 වැනි දිනැති දැන්වීම් හා සම්බන්ධ වී ඇති තාක් දුරට, ඉහත කී එක් එක් කොට්ඨාශයට සභිකයකු බැගින් තෝරා පත් කිරීමේ කාර්‍යය සඳහා ඡන්ද විමසීමක් පැවැත්වෙන එක් එක් ඡන්ද පොලේ පිහිටීම, ඡන්දය විමසීමේ දිනය සහ කාලය අවලංගු සහ බලරහිත විය යුතුවාක් මෙන් ම, සෑම විටම එසේ අවලංගු හා බලරහිත වී ඇතැයි සැලකිය යුතු බව, සහ

(ආ) ඉහත කී නගර සභාවේ දැනට ධුර දරන සභිකවරුන්ගේ ධුර කාලය අවසන් වීමට නියමිත දිනය ගැන සැලකිලිමත් වෙමින්, කළුතර දිස්ත්‍රික්කයේ මැතිවරණ නිලධාරියා විසින්, ඉහත කී එක් එක් කොට්ඨාශය සඳහා සභිකයකු බැගින් තෝරා පත් කිරීමේ කාර්‍යය පිණිස ඡන්දය විමසීමක් පැවැත්වෙන එක් එක් ඡන්ද පොලේ පිහිටීම, ඡන්දය විමසීමේ දිනය සහ කාලය ද නිශ්චිත ලෙස නියම කෙරෙමින් අළුත් දැන්වීම් ප්‍රසිඩ කළ යුතු බව,

මෙම ආඥාවෙන් ප්‍රකාශ කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති.

1970 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

12—917


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි

1014/1—ජේ 19263—5,700 (70/12)